<u>රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය - අතිරේක ලේකම් (ආයතන) තනතුර</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ පුරප්පාඩුව පවතින අතිරේක ලේකම් (ආයතන) තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මේ සඳහා අයදුම් කරනු ලබන නිලධාරීන් තම සේවා කාලය තුළ කිසිදු ආකාරයක විනයානුකූල දඬුවමක් ලබා නොමැති හෝ කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනාවක් ලබා දැනට/ඉදිරියේදී විනයානුකූලව කටයුතු නොකරන හෝ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා නොකරන නිලධාරියකු විය යුතුය. තවද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා අනෙකුත් අණපනත් සහ චක්‍රලේඛ විධිවිධාන පිළිබඳව මනා පරිචයක් ලත් නිලධාරියෙකු විය යුතු අතර එවැනි සේවා ස්ථානයක සේවය කර තිබීම යෝග්‍ය වේ.

03. ඒ අනුව ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් තම සේවා තොරතුරු ද ඇතුළත් කර සැකසූ ජීව දත්ත පත්‍රිකාවක් **<u>2026.02.06</u>** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපැල ඔස්සේ යොමු කළ යුතුය.

(i) ලියාපදිංචි තැපෑල - ජීවදත්ත පත්‍රිකාව බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ " අතිරේක ලේකම් (ආයතන) තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කර පහත දැක්වෙන ලිපිනයට යොමු කළ යුතුය.

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

(ii) විද්‍යුත් තැපැල - info@psc.gov.lk
මාතෘකාව (Subject) "අතිරේක ලේකම් (ආයතන) තනතුර සඳහා අයදුම් කිරීම" ලෙස සඳහන් කරන්න.

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
1200/9 රජමල්වත්ත පාර
බත්තරමුල්ල
2026.01.21